# අජිත් තිලකසේනගේ කෙටිකතා කෙරෙන් නූතනවාදය පිළිබිඹු වන ආකාරය

එම්. ඩී තරංගනී [1]

නූතනවාදය (modernism) යනු වික්ටෝරියානු යුගයෙන් පසු ව බිහි වූ වික්ටෝරියානු යුගයට ආවේණික අදහස් ප්‍රතික්ෂේප කළ විචාර වාදයකි. මේ විචාර වාදය ලාංකික කෙටිකතාකරුවකු වූ අජිත් තිලකසේනගේ කෙටිකතා ඇසුරින් කොතෙක් දුරට හඳුනාගත හැකි ද යන්න අධ්‍යයනය කිරීම මේ පර්යේෂණයෙහි අරමුණ වේ. උක්ත අරමුණ සපථ කරගනු වස් අජිත් තිලකසේනගේ "සතුරෝ, රාත්‍රියේ පූර්ව භාගය, පස්වසක්" යන කෙටිකතා සංග්‍රහ ත්‍රයය ප්‍රාථමික මූලාශ්‍රය කොටගැනිණ. ඒ කෙටිකතා සංග්‍රහ ත්‍රයය ඔස්සේ තිලකසේනගේ කෙටිකතාවල වස්තු විෂය ක්ෂේත්‍රය, ආඛ්‍යාන ක්‍රමවේදය, රචනෝපක්‍රම හා භාෂාව ආදියෙන් නූතනවාදී ලක්ෂණ පිළිබිඹු වන ආකාරය විමසනු ලැබිණ. එසේ ම ඒ සඳහා තිලකසේනට සමකාලීන කෙටිකතාකරුවකු වු ටෙනිසන් පෙරේරාගේ කෙටිකතා සංග්‍රහ ද ඉවහල් වී ඇත. එමඟින් අජිත් තිලකසේනගේ හා ටෙනිසන් පෙරේරාගේ කෙටිකතා සන්සන්දනයක් සිදු වන බැවින් මෙය තුලනාත්මක අධ්‍යයනයක් ද වේ. අජිත් තිලකසේනගේ කෙටිකතා සංග්‍රහ හා නූතනවාදී කලාව පිළිබඳ බොහෝ විද්වතුන් පර්යේෂණ කොට ඇත. ඔවුන්ගේ පර්යේෂණ මෙහි දී ද්විතීයික මූලාශ්‍රය ලෙස ඇසුරු කෙරිණ. මෙකී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයවලට අමතර ව සම්මුඛ සාකච්ඡා මඟින් ද දත්ත රැස් කරනු ලැබිණ. අජිත් තිලකසේනගේ කෙටිකතා කෙරෙන් නූතනවාදය පිළිබිඹු වන ආකාරය සම්බන්ධයෙන් අවසාන වශයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ අජිත් තිලකසේන නූතනවාදය අනුව යමින් කෙටිකතා නිර්මාණකරණයෙහි යෙදී සිංහල කෙටිකතාව නව මඟකට ගෙන ආ ලේඛකයකු වූ බවත්, ස්වාධීන මඟක යමින් කෙටිකතා කලාවෙහි තම අනන්‍යතාව ස්ථාපනය කළ ඔහු නූතනවාදය අනුව යමින් විදේශීය නූතනවාදී ලේඛකයන්ගේ ද ආභාසය ලබා කෙටිකතාකරණයෙහි නියතු බවත් ය.

**ප්‍රමුඛ පද:** නූතනවාදය, වික්ටෝරියානු යුගය, කෙටිකතා, ස්ධීන මඟ, විදේශ ආභාසය

[1] සිංහල අධ්‍යයනාංශය